බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ තැපැල් මුද්දර ගාස්තු වියදම රු.162,255 ක් වුවත් ආදායම් හා වියදම් ගිණුමේ රු.123,880 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයට අදාළ මුද්දර ගාස්තු වියදම රු.38,375 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉනිමඟක් මිළදී ගැනීම සඳහා වැය කළ රු.14,500 ක මුදල පුනරාවර්තන වැය යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ සේවක ණය ශේෂය රු.9,397 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළව විදුලි උපකරණ ගබඩා ශේෂය රු.190,421 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් ගබඩා ශේෂය රු.190,421 ක් අඩුවෙන් හා වියදම රු.190,421 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වියදම හා වියදම් ණයහිමියෝ රු.12,270 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත වියදම හා කර්මාන්ත ණයහිමි වටිනාකම රු.730,238 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත ණයගැතියෝ හා කර්මාන්ත ආධාර රු.716,747 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලිය රු.153,018 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) 2011 ,2012 හා 2013 වර්ෂයන් වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී ලැබී තිබූ රු.1,684,422 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණ අතර ප්‍රවර්තන වර්ෂයට උසාවි දඩ ආදායම් බිල් කිරීම් කර නොතිබුණි.

1.3.2 **නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.23,060,423 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,105,953 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

<u>ලැබිය යුතු ගිණුම්</u>

i. වසර ගණනාවක සිට පැවත එන විදුලිය වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.645,435 ක ශේෂය හා සභාවේ තැන්පත් යටතේ දක්වා ඇති රු.10,470 ක් වූ අගරු චෙක්පත් ශේෂයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. වසර ගණනාවක සිට එකතුකළ අගය මත බදු ගිණුමෙහි පවත්නා රු.329,555 ක ලැබිය යුතු ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.</u>

යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, අත්තිකාරම් ලේඛනය හා අදාළ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.223,837,291 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යෝක්ෂණය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>(i)134(1) වගන්තිය | - | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව දියුණුකළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපළ සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 160 වගන්තිය | - | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | - | සභාව සතු සියළු ඉඩම්, ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 371 (2)(ඇ) | 4,144,661 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාළ කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 (1)(2) | - | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර කල් ඉකුත් වූ තැන්පත් රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396(ඇ) | 31,698 | නිකුත් කර ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවා තිබූ චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iv) මුදල් රෙගුලාසි 1647(ආ) | - | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | වරිපනම් වලට යටත් වන , දේපළ වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGO/13/2016 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | සභාව සතු කඩකාමරවල උප බදුකරුවන් ලෙස සිටින අය හඳුනාගෙන උප බදුකරු බදුකරුවන් ලෙස පත් කර නීත්‍යානුකූල බදු අයිතිය පැවරීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඊ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සභා වාහනවල ඉන්ධන දහනය වාර්ෂිකව පරීක්ෂා කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.15,639,590 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,823,523 ක් විය.

2.2 මූල්‍ය පාලනය

ලංකා බැංකුව (බණ්ඩාරගම) 0-004720 අංක දරන ජංගම ගිණුමෙහි රු.2,875 ක ශේෂය වර්ෂ ගණනාවක් තිස්සේ නිෂ්ක්‍රියව පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| -------- | -------------- | --------- | --------- | ------------ | -------------- | --------- | --------- | ------------ |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 6,314,000 | 7,370,955 | 8,152,177 | 1,119,653 | 6,337,400 | 7,409,669 | 8,428,578 | 1,980,876 |
| (ii) කුලී | 1,422,000 | 1,528,500 | 1,527,490 | 118,285 | 1,578,200 | 1,009,800 | 1,134,815 | 117,275 |
| (iii) බලපත්‍ර ගාස්තු | 296,000 | 337,650 | 337,650 | - | 157,500 | 264,450 | 264,450 | - |
| (iv) වෙනත් ආදායම් | 21,662,000 | 6,987,252 | 75,328,820 | 58,632,272 | 74,826,500 | 1,684,422 | 54,846,207 | 66,337,923 |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.68,436,074 ක් වූ අතර වර්ෂය තුළ බිල් කිරීම් රු.16,224,357 ක් විය. වර්ෂය තුළ ලැබීම් රු.85,346,137 ක් හා මුද්දර ගාස්තු හා උසාවි දඩ සඳහා සිදුකර ඇති

ගැලපීමේ ශුද්ධ අගයේ හර එකතුව රු.60,635,918 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ හිඟය රු.59,950,210 ක් විය.

2.3.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟ ශේෂය රු.1,980,876 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.1,472,105 ක් හෙවත් සියයට 74 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම රු.3,639,102 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.2,948,220 ක් හෙවත් සියයට 81 ක් පමණක් අයකරගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට බිල් කිරීමෙන් රු.690,882 ක් හා පෙර වර්ෂවල හිඟයෙන් රු.508,770 ක් අයවිය යුතුව පැවතුන අතර සමස්ථ වරිපනම් බදු හිඟය රු.1,119,652 ක් විය.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් ආදායම සඳහා කාල විශ්ලේෂණ ලබාදී නොතිබුණි.

(ආ) ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු

2016 වර්ෂයට අදාළ හිඟ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු අයකර ගැනීම සඳහා නඩු පවරා තිබූ අතර ව්‍යාපාර 18 කින් රු.104,400 ක් හා කර්මාන්ත 18 කින් රු.18,000 ක් වශයෙන් එකතුව රු.122,400 ක් හිඟව පැවතුණි.

2.3.4 වෙනත් ආදායම්

(අ) දැන්වීම් පුවරු ආදායම

සමීක්ෂණ වාර්තා අනුව 2017 වර්ෂය සඳහා ස්ථිර දැන්වීම් පුවරු 30 ක් වෙනුවෙන් රු.430,400 ක් ලැබිය යුතුව තිබුණි.

(ආ) සතිපොළ ආදායම්

(i) 2017 ජනවාරි මාසය දක්වා සති පොළ වෙළඳසැල් මාසිකව රු.3,000 ක කුලී අයකිරීමේ පදනම මත ලබා දී තිබුණු අතර ව්‍යාපාරිකයින් 125 දෙනෙකුගෙන් රු.737,270 ක හිඟ කුලියක් 2016 දෙසැම්බර් 31 දිනය වන විට තිබුණි. එම හිඟ මුදල සමාලෝචිත වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සති පොළ බදු කරුවන්ගේ බදු ගිවිසුම් අහෝසි කර දෛනිකව පොළ ආදායම් එකතු කිරීමේදී 2017 ජනවාරි මාසයේදී දින 03 ක්, පෙබරවාරි මාසයේ දින 03 ක්, මාර්තු මාසයේදී එක් දිනයක්, අප්‍රේල් මාසයේ දින 05 ක්, මැයි මාසයේ දින 04 ක් හා ජූනි මාසයේ දින 02 ක් පොළ නොපැවැත්වීම මත ආදායම් එකතු කර නොතිබුණ අතර පොළ නොපැවැත්වීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු.7,429,557 ක් විය.

(ආ) මුද්දර ගාස්තු

i. සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.51,202,717 ක් විය.

ii. සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු බිල් කිරීම ලෙස දක්වා තිබුණේ 2015 වර්ෂය සඳහා හොරණ හා කළුතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබිය යුතු රු.5,302,830 ක මුද්දර ගාස්තු ආදායම පමණි.

iii. 2016 හා 2017 වර්ෂයන් සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු සඳහා උපලේඛන පිළියෙල කර ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර, 2016 හා 2017 වර්ෂවලට අදාළව බිල් කිරීම නිවැරදි නොවුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරනා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය පහසුව හා සුභ සාධනය සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් එක් කාරණාවක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

සභාව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉටු කිරීමට බලාපොරොත්තු වූ කර්මාන්ත 34 ක් සමාලෝචිත වර්ෂය තුලදී ඉටු කර නොතිබුණු අතර ක්‍රියාකාරි සැලැමෙහි ඇතුළත් කර නොතිබුණු කර්මාන්ත 22 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

සභාව විසින් කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් දෙල්දොරවත්තෙහි කොම්පෝස්ට් අංගනයක් පවත්වා ගෙන ගොස් තිබූ අතර වර්ෂය තුලදී රු.7,325,723 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි.

(ii) බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(iii) කසළ කළමනාකරණ කටයුතු සඳහා වැය වන පිරිවැය ආවරණය කිරීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සුභ සාධක සේවා සැපයීම

(i) අයදුම්පත් ඉදිරිපත් කර හා පුද්ගල ඉල්ලීම් මත ලේකම් හෝ කාර්යභාර නිලධාරීගේ අනුමැතිය මත අදාළ සුභ සාධක උපකරණ නිකුත් කිරීම සිදු කළද 2017 වර්ෂයේදී ලබාදුන් උපකරණ අඩුවෙන් භාර දීමේ අවස්ථා 14 ක් වූ අතර පාඩුව අය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි. එසේ ලබාගත් උපකරණ අඩුවෙන් භාරදුන් අවස්ථා වලදී ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) කායවර්ධන මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල හා කාය වර්ධන උපකරණ අබලන් තත්ත්වයට පත්ව ඇති නමුත් ඒවා නවීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>මාර්ග පළුදු අළුත්වැඩියාව</u>

පළුදු කරන ලද මාර්ග සැලැස්මට අනුව පළුදු කරන ලද කොන්ක්‍රීට් මාර්ග 139 ක්ද, කුට්ටි ගල් ඇතිරූ මාර්ග 05 ක්ද, කාපට් මාර්ග 06 ක්ද, අළුත්වැඩියා කළ යුතුව තිබුණි. කෙසේ නමුත් අළුත්වැඩියා කර තිබුණේ ඉන් කොන්ක්‍රීට් මාර්ග 73 ක් පමණි.

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) තථ්‍ය කාර්ය මණ්ඩලය 198 දෙනාට අමතරව අනියම් සේවකයින් 09 දෙනෙකුද සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩලයට ඇතුළත් වී තිබුණි.

(ආ) පුරප්පාඩුව පැවති ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කිරීම කළමනාකරණ සහකාර පළමු පන්තියේ නිලධාරිනියක විසින් ඉටුකරමින් තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 මගින් ස්ථිර කරන ලද සේවකයින් 18 දෙනෙකු තථ්‍ය කාර්ය මණ්ඩලයට ඇතුළත් වී තිබුණි.

(ඈ) කළමනාකරණ සහකාර තනතුරු 02 ක අතිරික්තයක් විය.

(ඉ) සභාවේ කාර්යය මණ්ඩල තොරතුරුවලට අනුව සේවයේ යෙදෙන ක්ෂේත්‍ර කම්කරුවන් 66 න් 33 ක් ඔවුනට අදාළ වාර්තා නඩත්තු කටයුතු වලින් බැහැර රාජකාරීවල යෙදෙන අතර සෞඛ්‍ය කම්කරුවන් 32 න් 14 ක් අදාළ කාර්යයේ නොයෙදෙන බව නිරීක්ෂණය විය.

3.4 <u>වත්කම් කළමනාකරණය</u>

3.4.1 <u>වත්කම් ලේඛනගත නොකිරීම</u>

(අ) සභාව සතුව පවතින ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් ගොඩනැගිලි වටිනාකම ලෙස රු.97,089,333 ක් දක්වා තිබුණි. එම වටිනාකම 2016 හා 2017 වර්ෂයේදී සිදුකර ඇති ගොඩනැගිලි ඉදිකිරීම් වටිනාකම හා එක් ඉඩමකට අදාළ වටිනාකම පමණි.

(ආ) ඉඩම් වෙන්දේසි මගින් පොදු පහසුකම් සඳහා සභාවට ලැබී තිබූ සියළු ඉඩම් පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

(ඇ) සභාව සතුව පවත්නා ස්ථාවර වත්කම් ලේඛන කිසිවක් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ දී ඇති උපලේඛනයන්හි නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඈ) සභාවට අයත් මාර්ග නිවැරදිව හඳුනා ගැනීමට, ගැසට් කිරීමට හෝ ලේඛනගත කිරීමට හෝ පවතින ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4.2 <u>නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්</u>

යන්ත්‍රානුසාරයෙන් කළුගල් කැඩීම සඳහා රු.2,472,740 ක් වැය කර 2008 වර්ෂයේදී මිළදී ගෙන තිබූ කළුගල් කැඩීමේ යන්ත්‍රය 2009 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

3.4.3 <u>තොග පාලනය</u>

<u>විදුලි භාණ්ඩ තොග නිකුත් කිරීම හා භාර ගැනීම</u>

(අ) 2017 ඔක්තෝබර් මාසය දක්වා ප්‍රධාන ගබඩාවෙන් වොට් 23 ප්‍රතිදීප්ත බල්බ 720 ක් නිකුත් කර තිබූ අතර අධිකාරිපත්තු උපකාර්යාලයේ තොග පොතෙහි ලැබීම් ලෙස සටහන් වී තිබුණේ බල්බ් 384 ක් පමණි. ඒ අනුව බල්බ් 336 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

(ආ) තල්පිටි බද්ද උපකාර්යාලයට ප්‍රධාන කාර්යාලය විසින් අවස්ථා 02 කදී බල්බ 200 ක් ලබා දී තිබූ අතර තල්පිටි බද්ද උපකාර්යාලයට ලැබීම් ලෙස තොග පොතෙහි සටහන් වී ඇත්තේ බල්බ් 100 ක් පමණි. ඒ අනුව රු.51,000 ක් වටිනා වොට් 23 ප්‍රතිදීප්ත බල්බ් 100ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

3.5 ප්‍රසම්පාදනය

(අ) සැපයීම් හා සේවා

(i) 2017 වර්ෂයේ සැපයුම් කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා මිළ කැඳවීම 2016 ඔක්තෝබර් මාසයේදී සිදුකර තිබුණත් 2017 වර්ෂයේ සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණේ විශාල කාල ප්‍රමාදයකින් පසුව 2017 ජූනි මාසයේදීය. වර්ෂය ආරම්භයේදීම වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචිය සිදු නොවීම හේතුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමේ ක්‍රියාවලිය ඵලදායී ලෙස ඉටුවී නොතිබුණි.

(ii) වොට් 23 ප්‍රතිදීප්ත බල්බ මිළදී ගැනීමේදී 2017 වර්ෂයේදී අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සැපයුම්කරු තෝරා නොගෙන වැඩිම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සැපයුම්කරු තෝරා ගැනීම නිසා සභාවට රු.206,155 ක පාඩුවක් සිදු වී තිබුණි.

(iii) සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන තිබියදීත් ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ මිළදී ගෙන තිබුණු අවස්ථා පැවතුණි.

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

අරුක්ගොඩ දකුණ ජනාධිපති මාවත තුන්වන පටුමඟ කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.925,047 ක වියදමක් දරා තිබුණද කරන ලද භෞතික පරීක්ෂණයේදී එකී මාර්ගයේ බොහෝ ස්ථානවල ගල් මතු වී කඩතොලු වී තිබුණ අතර එම මාර්ගය නිසි ප්‍රමිතියකින් යුතුව නිමකර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත හා තථ්‍ය ආදායම සියයට 6.4 සිට සියයට 241 දක්වාත් වියදම සියයට 6.9 සිට සියයට 205 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | --------- | | ---------- |
| (අ) | ගිණුම්කරණය | i. | ගිණුම්වලින් අත්හැරීම් තිබීම හා අඩුවෙන් හා වැඩියෙන් සටහන් වීම් තිබීම. |
| | | ii. | ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) | වත්කම්/ දේපළ | i. | ලේඛනගත නොකිරීම. |
| | | ii. | ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) | ආදායම් පරිපාලනය | | හිඟ බදු අයකිරීම ප්‍රමාණවත් පරිදි සිදු නොවීම. |
| (ඈ) | සේවකමණ්ඩල කළමනාකරණය | i. | කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම. |
| | | ii. | පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම. |
| (ඉ) | අයවැය පාලනය | i. | අයවැය ගත හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම. |
| | | ii. | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම. |